මගේ අංකය / எனது இல. / My No. වි.වැ.උපදෙස් ලිපි අංක: 09/2019 ඔබේ අංකය / உமது இல. / Your No. ........................ දිනය / திகதி / Date 2019.06.17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,

**<u>PD 3 මාර්ගගත අයදුම්පත්‍රය සංශෝධනය කිරීම.</u>**

විශ්‍රාම ගන්නා නිලධාරීන්ගේ සම්පූර්ණ සේවා කාලය තුළ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දායක මුදල් අයකිරීම පිළිබඳ සහතික කිරීම සඳහා ආකෘතියක් ඇතුළත් කර (ඇමුණුම 01) PD 3 මාර්ගගත අයදුම්පත්‍රය 2019.06.12 දින සිට සංශෝධනය කර ඇත.

02. එබැවින්, 2019.06.12 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත ඇතුළත් කරන PD 3 අයදුම්පත්‍රවල මුද්‍රිත පිටපත මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී එය සමඟ ඉහත ආකෘතිය අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව කාරුණිකව දන්වමි. එම ආකෘති පත්‍රය රහිතව ඉදිරිපත් වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කර හරවා යැවෙනු ඇත.

03. ඒ අනුව, එම අයදුම්පත්‍රවලට අදාළ විශ්‍රාමිකයන් විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට ඉහත දායක මුදල් අයකිරීම පිළිබඳ ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතික කිරීමේ ලිපියක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

05. තවද, PD 3 මාර්ගගත අයදුම්පත්‍රය මුද්‍රණයේ දී ලැබෙන උපදෙස් පත්‍රිකාව විශ්‍රාමිකයා වෙත ලබා නොදී එය ද මුද්‍රිත අයදුම්පත්‍රය සමඟ මෙම දෙපාර්තමේන්තුව වෙත එවන අවස්ථා රාශියක් නිරීක්ෂණය වී ඇත. එමනිසා විශ්‍රාම වැටුප සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අත්‍යවශ්‍ය ලේඛන නොමැතිව විශ්‍රාමිකයන් පැමිණීම හේතුවෙන් ඔවුන් සඳහා වෙනත් සම්මුඛ පරීක්ෂණ දින ලබා දී ආපසු හරවා යැවීමට සිදු වේ. එමගින් විශ්‍රාමිකයන් හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැඩි අපහසුතාවයට පත්වන බව ද ඔබගේ අවධානයට යොමු කරමි. එබැවින් **එම උපදෙස් පත්‍රිකාව අනිවාර්යයෙන්ම විශ්‍රාමිකයා වෙත ලබාදීමට ඔබගේ විෂය භාර නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.**

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

Annex 01

# Recovery of Contributions towards Widows'/Widowers' and Orphans' Pension Scheme

## Declaration of Subject Officer

Name of the retiring officer - ……………………………………………………………………..

NIC - ……………………………………………………………………...

W & OP No. - ……………………………………………………………………...

I hereby certify that the contributions towards the Widows'/Widowers' and Orphans' Pensions Scheme were **fully recovered** for the **whole service period** of the above retiring officer according to all the information provided by the above retiring officer/other government institutions/ personal file of the retiring officer.

Date - ……………….

………………………………

Signature

## Declaration of the Accountant of Institution

I hereby certify that the contributions towards Widows'/Widowers' and Orphans' Pension Scheme were **fully recovered** for the **whole service period** of the above officer.

Official Stamp

Signature

Date - ………………..